කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ පුල්මුඩේ යන්ත්‍රාගාරයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. නිෂ්පාදන ඉංජිනේරු (Production Engineer)

කළමනාකාර සේවා ගණය (MM-1-1)

පුරප්පාඩු ගණන - 01 කි

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු (නිෂ්පාදන) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු /සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

2. නිෂ්පාදනය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමක නොඅඩු මට්ටමක ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රය් කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කණිෂ්ඨ කළමනාකාර (JM-1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂෙත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. යාන්ත්‍රික ඉංජිනේරු (Mechanical Engineer)

කළමනාකාර සේවා ගණය (MM-1-1)

පුරප්පාඩු ගණන - 01

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු (යාන්ත්‍රික) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු /සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/හෝ පිළිගත් ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රෙයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

2. යාන්ත්‍රික කටයුතු පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමක නොඅඩු මට්ටමක ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රය් කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කණිෂ්ඨ කළමනාකාර (JM-1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂෙත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. භූ විද්‍යාඥ (Geologist)

කළමනාකාර සේවා ගණය (MM-1-1)

පුරප්පාඩු ගණන -01 කි

බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

අධ්‍යාපන සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භූ විද්‍යා උපාධියක් (රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ඇතුළත්) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රෙයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමග

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක භූ විද්‍යා ක්ෂේත්‍රය අදාළ වසරක පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

1. ඉහත සඳහන් බාහිර සුදුසුකම් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

MM-1-1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MM-1-1 හි රු 91,690/-=2480X10,3450X15/-=168,240/- වැටුප් පරිමාණයේ රු.91,690/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව බඳවා ගන්නා දින සිට රු.81,710/- වැටුපක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

04. අධිකාරි (Superintendent)

කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM-1-2)

පුරප්පාඩු ගණන - 01 කි

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

(1). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ඉංජිනේරු උපාධියක් (කැනීම්/යාන්ත්‍රික/විදුලි/නිෂ්පාදන/සිවිල්)

(2). කැනීම්/යාන්ත්‍රික/විදුලි/නිෂ්පාදන/සිවිල් කටයුතු පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම.

(3). කැනීම්/යාන්ත්‍රික/විදුලි/නිෂ්පාදන/සිවිල් කටයුතු පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ 06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද

(4). කැනීම්/යාන්ත්‍රික/විදුලි/නිෂ්පාදන/සිවිල් කටයුතු පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවිනතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම් කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

(2) කළමනාකරණ සහකාර තාක්ෂණික (MA-2-1) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයෙ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම .

JM-1-2 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - JM-1-2 හි රු 74,010/-=1360X10,2040X18/-=124,330/- වැටුප් පරිමාණයේ රු.74010/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව බඳවා ගන්නා දින සිට රු.66,781/- වැටුපක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

05. ඉංජිනේරු සහකාර (Engineering Assistant)

තාක්ෂණික සේවා ගණය (MA 2-1)

පුරප්පාඩු ගණන - 07 කි

බාහිර අයදුම්කරුවන් සඳහා

තාක්ෂණික නිපුනතා /ප්‍රවීණතා

ඉංජිනේරු සහකාර තනතුරෙහි කර්ය භාරයට අදළව තෘතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි කැනීම්/ යාන්ත්‍රික /විදුලි/සිවිල්/ නිෂ්පාදන ක්ෂේත්‍රයට ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වැනි (05) මට්ටමට නො අඩු වන්නාවූ පාඨමාලාවක් සාර්ථකව හදරා තාක්ෂණික නිපුනතා / ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

MA-2-1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MA-2-1හි රු 50,540/-=540X10,630X7, 890x4/,1190x20-=87,710/- වැටුප් පරිමාණයේ රු.50,540/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව බඳවා ගන්නා දින සිට රු.46,960/- වැටුපක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

06. කළමනාකරණ සහකාර (Management Assistant)

තාක්ෂණික නොවන සේවා ගණය (MA 1-1)

පුරප්පාඩු ගණන - 02 කි

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන

(1) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i සිංහල/ දෙමළ

ii. ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රිසි භාෂාවද ඇතුලත්ව එක් වරකදී විෂයන් හයකින් (6) සමත් වී තිබීම හා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍යය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

සමග

තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් :- පරිගණක වදන් සැකසීම / යතුරු ලියනය පිළිබඳව තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම.

(1) අභ්‍යන්තර අයදුම් කරුවන්

ප්‍රථමික ශ්‍රේණිය - ශිල්පිය නොවන අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "අ" "ආ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැක.

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල/ දෙමළ

ii. ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රිසි භාෂාවද ඇතුලත්ව එක් වරකදී විෂයන් හයකින් (6) සමත් වී තිබීම

හා

පරිගණක වදන් සැකසීම / යතුරු ලියනය පිළිබඳව තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම.

(ආ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින්අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

MA-1-1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MA-1-1 හි රු 46,220/-=540X10,630X7, 890x4,1190x20-=83,390/- වැටුප් පරිමාණයේ රු.46,220/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව බඳවා ගන්නා දින සිට රු.43,312/- වැටුපක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

07. කාර්මික / මෝටර් කාර්මික (Mechanic/ Motor Mechanic)

ශිල්පිය සේවා ගණය (PL 3)

පුරප්පාඩු ගණන - 01 කි

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන හා / වෘත්තීය සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක්(6) සමත් වී තිබීම.

සමග

ශිල්පිය නිපුණතා /ප්‍රවීණතා

කාර්මික/ මෝටර් කාර්මික තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතික හා වෘත්තීයිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත්කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

1. කාර්මික/ මෝටර් කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහක (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් කාර්මික/ මෝටර් කාර්මික තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වෙනි (04) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රථමික අර්ධ ශිල්පිය (PL-2) හෝ ප්‍රථමික ශිල්පිය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

2. කාර්මික/ මෝටර් කාර්මික තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

08. පෑස්සුම්කරු (Welder)

ශිල්පිය සේවා ගණය (PL 3)

පුරප්පාඩු ගණන - 03 කි

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන හා / වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක්(6) සමත් වී තිබීම.

සමග

ශිල්පිය නිපුණතා /ප්‍රවීණතා

පෑස්සුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

01. පෑස්සුම්කරු තනතුරෙහි වසර පහක (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් පෑස්සුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වන (4) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රථමික අර්ධ ශිල්පිය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පිය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

02. පෑස්සුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

09. වැද්දුම්කරු (Fitter)

ශිල්පිය සේවා ගණය (PL 3)

පුරප්පාඩු ගණන - 02 කි

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන හා / වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක්(6) සමත් වී තිබීම.

සමග

ශිල්පිය නිපුණතා /ප්‍රවීණතා

වැද්දුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

1. වැද්දුම්කරු ක්ෂේත්‍රයෙහි වසර පහක (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් වැද්දුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වන (4) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රථමික අර්ධ ශිල්පිය (PL-2) හෝ ප්‍රථමික ශිල්පිය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

2. වැද්දුම්කරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත්කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වන (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

10. වියළන යන්ත්‍ර ක්‍රියාකරු (Dryer Operator)

ශිල්පිය සේවා ගණය (PL 3)

පුරප්පාඩු ගණන - 01 කි

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයයන් හයක්(6) ක් සමත් වී තිබීම.

සමග

ශිල්පිය නිපුනතා /ප්‍රවීණතා

වියළන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම

1. වියළන යන්ත්‍ර ක්‍රියාකරු ක්ෂේත්‍රයෙහි වසර පහක (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් /වෘත්තීය පුහුණු ආයතනයකින් වියළන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වන (4) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රථමික අර්ධ ශිල්පිය (PL-2) හෝ ප්‍රථමික ශිල්පිය නොවන (PL-1) සේවා ගණයක සේවකයිත්

හෝ

2. වියළන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

11. එන්ජින් ඩ්‍රයිවර් (විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු) (Engine Driver)

ශිල්පිය සේවා ගණය (PL 3)

පුරප්පාඩු ගණන - 01 කි

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක්(6) සමත් වී තිබීම.

සමග

ශිල්පිය නිපුණතා /ප්‍රවීණතා

විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදසුකම් වලින් එකක් ලබා තිබීම

1. විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු ක්‍රියාකරු ක්ෂේත්‍රයෙහි වසර පහක (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් /වෘත්තීය පුහුණු ආයතනයකින් විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (4) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රාථමික අර්ධ ශිල්පිය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පිය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

2. විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

12. ලියවන පට්ටල්කරු (Latheman)

ශිල්පිය සේවා ගණය (PL 3)

පුරප්පාඩු ගණන - 01 කි

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් හයක්(6) සමත් වී තිබීම.

සමග

ශිල්පිය නිපුණතා /ප්‍රවීණතා

1. ලියවන පට්ටල් ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදසුකම් වලින් එකක් ලබා තිබීම

1. ලියවන පට්ටල් ක්‍රියාකරු ක්ෂේත්‍රයෙහි වසර පහක (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් ලියවන පට්ටල් ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වන (4) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රාථමික අර්ධ ශිල්පිය (PL-2) හෝ ප්‍රථමික ශිල්පිය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

2. ලියවන පට්ටල් ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදළව තෘතියිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවත්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම.

PL-3 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - PL-3 හි රු 43,280/-=490X10,540X10,590X10,630X12-=67,040/- වැටුප් පරිමාණයේ රු.43,280/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව බඳවා ගන්නා දින සිට රු.40,834/- වැටුපක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

13. ආරක්ෂක නියාමක (Security Guard)

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL-1)

පුරප්පාඩු ගණන - 03 කි

බඳවා ගැනිමේ සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයට පෙනී සිටීම.

PL-1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - PL-1 හි රු 40,500/-=450X10,490X10, 540X7,590X15-=62,530/- වැටුප් පරිමාණයේ රු.40,500/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව බඳවා ගන්නා දින සිට රු.38,488/- වැටුපක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

දීමනා හා ප්‍රතිලාභ

දීමනා

01. භාණ්ඩාගාරය අනුමත කළ රු.17,800/- වන ජීවන වියදම් දීමනාව
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරිදීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. භාණ්ඩාගාරය අනුමත කළ රු.1800/- වන මාසික ප්‍රවාහන දීමනාව
05. රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන දීමනාව. (MM-1-1 හා JM-1-2 වැටුප් කාණ්ඩ සඳහා පමණි)
06. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 ප්‍රකාරව රු.25,000/- වන වෘත්තීය දීමනාව. (MM-1-1 වැටුප් කාණ්ඩය සඳහා පමණි)

ප්‍රතිලාභ

01. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු.300,000/-ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    ii. වසරක් සඳහා රු.25,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    iii. වසරක් සඳහා රු.10,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
02. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබා දීම.
    i. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසර දෙකකට වරක් රු.12,000/- ක දීමනාව
    ii. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසරකට වරක් බාහිර ප්‍රතිකාර වෙනුවෙන් රු.5000/- මුදලක් ලබා දීම
    iii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/- මුදලක් ලබා දීම.
03. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක් දැරිය යුතු අතර, ආයතනය විසින් 15% ක දායකත්වයක් දරනු ලැබේ. එමෙන්ම සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3% දායකත්වයක් ආයතනය විසින් දරනු ලැබේ.

පොදු කොන්දේසි

1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි. (පොලිස් වාර්තාව ලබා දිය යුතුවේ)
4. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ මූලු ඉපයීම් වලින් උපයන විට ගෙවීම් බද්ද අය කරනු ලැබේ.
5. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අදළ වයස් මට්ටම ගණනය කරනු ලබයි.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඔබගේ ඊමේල් ලිපිනයද ඇතුලත් කර ඔබගේ අත්සන සහිතව අයදුම්පත එවිය යුතු අතර, ඔබගේ අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සියලුම අධ්‍යාපන, වෘත්තීය හා සේවා සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත් ඒ සමග එවිය යුතුවේ. (නිසි පරිදි සහතික පත්‍රවල ජායා පිටපත් යොමු කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

ඔබ විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2026.11.30 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් අයදුම්පත් යොමු කළ යුතු වේ.

තවද, උක්ත තනතුරු සඳහා බඳවා ගැනීම පිළිබඳව අවසාන අධිකාරි බලය ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

සභාපති
ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්
අංක 341/13, සරණ මාවත, රාජගිරිය.